# සති පාසල කාර්ය පත්‍රිකාව

**1.නිපුණතාව 2.0 :** ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.4 :** තමා තෝරාගත් තේමාවක් අනුව නිර්මාණාත්මකව කුසලතා ප්‍රදර්ශනය කරයි.

**පාඩම -** තේමාවක් තෝරාගෙන නාට්‍ය පෙළක් රචනා කරමු.

## 2.ශිෂ්‍යයා විසින් කල යුතු කාර්යයන්:

- විවිධ කතාන්දර , වේදිකා නාට්‍ය , චිත්‍රපට නරඹා තේමාවන් හඳුනාගන්න.

- නාට්‍ය පෙළ රචනයකදී අවධානය යොමු කල යුතු කරුණු පිළිබඳව නාට්‍ය චිත්‍රපට නරඹමින් අවධානය යොමු කරන්න.

- පහත දී ඇති ඉගෙනුම් පත්‍රිකා හා අනෙකුත් ඉගෙනුම් ආධාරක ඇසුරෙන් දි ඇති ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන්න.

- තේමාවන් සහ පෙළ රචනයේදී අවධානය යොමු කල යුතු කරුණු සම්බන්ධයෙන් වැඩි දුරටත් තොරතුරු එක් රැස් කරන්න.

- පාසල ආරම්භයේදී ඔබගේ අනාවරණයන් පන්තිය ඉදිරියේ ඉදිරිපත් කරන්න.

**3.ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත්පත, කියවීම් පත්‍රිකා, Websites සහ ඉගෙනුම් ආධාරක :-**

- **eතක්සලාව -**
  https://www.e-thaksalawa.moe.gov.lk/web/en/

- **eනැණපියස -**
  course : 09 ශ්‍රේණිය නාට්‍ය හා රංගකලාව
  https://enenapiyasa.lk/

- # You Tube –

**Labu Kiribath - හාවා සහ නරියා ලබු කිරිබත් - sinhala jana kathaa - sinhala kathandara**

https://youtu.be/Tz8tZJretTA

**ආඬි හත්දෙනාගේ කැඳ හැලිය**

https://youtu.be/2uAKCPRQcLk

**ලබු ගෙඩියේ තොවිලය**

https://youtu.be/qPk6D_DOEBc

**සූරිය අරණ**

https://youtube.com/playlist?list=PLm6RCG2b5Bx3I1B-vAcE9g55Pp4hh3PFG

**ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල්**

https://en.m.wikipedia.org/wiki/Alexander_Graham_Bell

**අයිසෙක් නිව්ටන්**

https://en.m.wikipedia.org/wiki/Isaac_Newton

- **කියවීම් පත්‍රිකාව -**

- **තේමාව,**

තේමාව ලෙස අදහස් කරන්නේ නාට්‍යයක හෝ වෙනත් කිසියම් කලා මාධ්‍යයක් මඟින් ලබාදෙන පණිවුඩයයි. මෙය නාට්‍යයක යටි පෙළ අදහස යනුවෙන් ද හඳුන්වනු ලබයි. නාට්‍ය තේමාව මඟින් නාට්‍යය ද සාර්ථක වේ. එමඟින් ප්‍රේක්ෂකයා මනා රසවින්දනයක් ලබා ගනී. ඕනෑම කලා මාධ්‍යක් නිර්මාණය වී ඇත්තේ තේමාවක් පෙර දැරි කරගෙන ය. නාට්‍ය ජන කතා, ජාතක කතා, චිත්‍රපට, ටෙලි නාට්‍ය, නව කතා, විෂයානු බද්ධ පාඩම් යන මේ සියල්ලෙහි ම තේමාවක් ඇත.

උදා :-

- හාවයි නරියයි ලබු කිරිබත් ඉව්ව හැටි - ජන කතාව
- ආඬි හත්දෙනාගේ කැඳ හැලිය - ජාතක කතාව
- සිංහබාහු - වේදිකා නාට්‍යය
- සූරිය අරණ - චිත්‍රපටය
- හෝ ගානා පොකුණ - චිත්‍රපටය
- ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල් - දුරකථනය නිපදවීම
- පයිතගරස් චරිතය
- නිව්ටන්ගේ ගුරුත්වාකර්ෂණ නියමය සම්බන්ධ කතාව

ඉහත විවිධ තේමා රැගත් කතාවන් නොයෙකුත් පණිවුඩ මිනිසාට ලබා දේ. එම තේමාවන් පහත දැක්වේ.

- උත්සාහවන්තයා ජයගනී.
- සිත ඇත්නම් පත කුඩා ද?
- සිටියෙත් හොඳට හැදී දෙවියොත් නමට වඳී.
- දුප්පත්කම දියුණුවට බාධාවක් නොවේ.
- අභියෝග හමුවේ නොසැලී සිටීමෙන් ජීවිතය ජය ගත

- **නාට්‍ය පෙළ රචනයේ දී අවධානය යොමු කළ යුතු කරුණු,**

  - කතාවේ ඇති අපූර්ව බව හෙවත් නොඇසූවිරූ, නොදුටු විරූ බව
  - සිදුවීම මුල, මැද, අග වශයෙන් මනාව ගැලපීමේ හැකියාව
  - කිසියම් අරමුණක් පෙරදැරි කරගෙන කතාව විකාශනය කළ හැකි වීම
  - කුතුහලයෙන් යුකුත වීම
  - ගැටුම් සහිත වීම
  - විශ්වාසනීය ව ඉදිරිපත් කිරීමට හැකි වීම
  - ප්‍රේක්ෂකයාට රසයක් ලබා ගත හැකි විය යුතු මෙන් ම බුද්ධි ගෝචර වීම
  - වේදිකාව මත ප්‍රති නිර්මාණය කළ හැකි සිදුවීම්, ක්‍රියා හා ස්ථාන සහිත වීම

කතාවක් තෝරාගෙන නාට්‍ය රචකයා තමාගේ පරිකල්පන ශක්තිය, නිර්මාණශීලී චින්තනය යොදා ගනිමින් නාට්‍ය පිටපත ලිවිය යුතු ය. නාට්‍යයේ තේමාව උද්දීපනය වන පරිදි සංවාද ගොඩ නැගිය යුතු ය.

**4.මෙම සතියට නියමිත පාඩම මඟින් ආවරණය විය යුතු ඉගෙනුම් ඵල:**

- තේමාවක් යනු කුමක්දැයි හඳුනා ගැනීම.
- විවිධ තේමාවන් හඳුනා ගැනීම.
- නාට්‍ය පෙළ රචනයේදී අවධානය යොමු කල යුතු කරුණු හඳුනා ගැනීම .
- නාට්‍ය පෙළ රචනයට යොමු වීම.

**5.ඇගයීම /තක්සේරකරණ ක්‍රමවේදය හා ආකෘති:**

1.සපයා ඇති නාට්‍ය , චිත්‍රපට නරඹා ඒවායේ ඇතුළත් විවිධ තේමාවන් ලියා දක්වන්න .

2.නාට්‍ය පෙළ රචනාවන් සඳහා සුදුසු තේමාවන් ලැයිස්තුවක් සකස් කරන්න .

3.නාට්‍ය පෙළ රචනයේදී අවධානය යොමු කල යුතු කරුණු මොනවාද ?

4.සුදුසු තේමාවක් යටතේ නාට්‍ය පෙළක් රචනා කරන්න.

**සැකසුම :- S.S.C ජයසූරිය**

**ර/නිවි/සිංහලගොඩ විද්‍යාලය**